# සුළු අපනයන වූ අපේ පාරම්පරික

ජාතියේ අවශ්‍යතා පිරිමසින සේ සකස්ව තිබූ අපේ ආර්ථික මෙන් ම සමාජ රටාව ද විදේශික ආක්‍රමණිකයන්ගේ බලපෑම් නිසා නිසා වෙනස්ව රට පිරිහීමට ලක්වූ අයුරු පුන පුනා කිවයුත්තක් නොවේ. විශේෂ යෙන්ම බ්‍රිතාන්‍යයන්ට අප රට නතුවීමෙන් පසුව අපේ ආර්ථික රටාව ඔවුන් ගේ අවශ්‍යතාවයන් පිරිමසින අයුරින් සකස් කර ගන්නා ලදී. ස්වයංපෝෂිත ජාතියක පදනම වූ අපේ ගොවිතැන් ක්‍රමය හා ඉඩම් භුක්ති රටාව වෙනුවට පිටරට වෙළඳපල ඉලක්ක කර ගත් වැවිලි බෝග ක්‍රමයක් අප වෙත කරපින්නවනු ලැබිණ. කෝපි, සිංකෝනා වැනි බෝග වලින් ඇරඹුන නව රටාව තේ, රබර්, පොල් යන ප්‍රධාන වගාවන් පදනම් කර ගත් ආර්ථික රටාවක් නැතිනම් මෙම බෝගවල ආදයමින් දිවි රැක ගැනීමට [illegible]න දරණ රටක් ලෙසට ශ්‍රී ලංකාව හඳුන් වා දෙමින් ස්ථාපිත විය.

එතෙක් ශ්‍රී ලංකාව පෙරපර දෙදිගම ප්‍රසිද්ධ ව තිබුනේ ඉතා අගනා කුළු බඩු වගා කරන රටක් ලෙස දක්වීම නිවැරදිය. මිනිසාට ඉතා ආදි යුගයේ ම ඇබ්බැහි වූ කුළු බඩු වෙළඳාම පිළිබඳව අප රට ප්‍රසිද්ධ වූයේ හය වන සියවසේ දි තරම් ය. තුන්වන හා පස්වන සියවස් කාලය තුළ භාරතයට කුළු බඩු පිළිබඳව ලැබී තිබුණ තැන ඉන් පසු අපට හිමි විය. කුළු බඩු සොයමින් දේශ ගවේෂණයේ යෙදුණු නාවිකයන් ගේ, හමුදවන් ගේ මෙන් ම වෙළෙන්දන් ගේ උකුසු ඇස් අප රට දෙසට එල්ලවූයේ මේ අවදියේ පටන් [illegible]ය.

වී ගොවිතැනින් යැපුණු අපට මෙසේ අතිරේක ආදයම් ලබා දෙමින් තිබූ කුරුඳු, කරදමුංගු, ගම්මිරිස්, සාදික්කා, කරාබු, හා පැඟිරි වැනි වගාවන් කෙරේ යළිත් රජයේ අවධානය යොමු වූයේ අප ස්වාධීන ජාතියක් වීමෙන් පසුව ය. නිසරු තේ ඉඩම්වල ඒ වෙනුවට මෙම බෝග වගා කිරීමේ වැද ගත්කම 1958 කෘෂිකාර්මික සැලැස්මෙන් පෙන්වා දෙනු ලැබිණ. රජයේ ආධාර ඇති ව මෙවැනි නිසරු ඉඩම් අක්කර විසිදහක පමණ මෙම වගාවන් කළයුතු බැව් පිළි ගැණුනි. ඉන්පසු මේ ගැන දැඩි අවධානය යොමු කළ ඉඩම් භුක්ති කමිටුව මෙම ඉඩම් ප්‍රමාණය අක්කර හතළිස් පන්දහක්

## කුළු බඩු

තරම් වෙතැයි ගණන් බලන ලදී. මෙම ඉඩම් කොකෝවා, කෝපි, ගම්මිරිස්, කුරුඳු, පොල් වැනි වගාවන් සඳහා යොද ගැනීම පිළිබඳව කරුණු හැදැරිය යුතු බව ද කමිටුව විසින් පෙන්වා දෙන ලදී.

1968 දී මේ පිළිබඳව තම අවධානය යොමු කළ තේ වගා කොමිසම නිසරු තේ ඉඩම්වල කොකෝවා, කෝපි, කරාබු, කරද මුංගු, ගම්මිරිස්, තණ වගා හා සෙසු ආහාර බෝග වගා කළ හැකි බව පෙන්වා දෙන ලදී. එක්වරම මෙම බෝග වගා කරනු වෙනුවට' අදළ සෙසු කරුණ පිළිබඳ මනාව කරුණු හදරා පිළිගත් ප්‍රතිපත්ති යටතේ මෙවැනි බෝග විවිධාංගකරණ වැඩ සට හනක් ක්‍රියාත්මක කළයුතු බව ද තේ කොමි සම විසින් අවධාරණයෙන් පෙන්වා දුණි.

තේ කොමිසමේ නිර්දේශ හැදැරූ රජය මෙරට කෘෂිකර්මය විවිධාංකරණ සැලැස්

මක් සකස් කිරීමේලා එක්සත් ජාතීන් ගේ සංවර්ධන සැලැස්මේ හා ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ සහාය පතන ලදී. ඉන් පසු මෙරට කෘෂිකර්ම විවිධාංගකරණ යෝජනා ක්‍රමය ආරම්භ කොට පුළුල් ලෙස කරුණු හැදෑරීමක් කරනු ලැබිණි.

1. තේ හා රබර් වගාවන්හි අනාගතය හා එම ඉඩම් විවිධාංගකරණය කිරීම.
2. මෙම ඉඩම්වලට සුදුසු වෙනත් බෝග නිර්දේශ කිරීම.
3. විවිධාංගකරණයේ දී අවශ්‍ය වන නව දැනුම හා ආර්ථික අවශ්‍යතාවයන් මෙන්ම ව්‍යාප්ති සේවාවන් නිර්දේශ කිරීම හා
4. කෘෂිකර්ම විවිධාංගකරණයේ මුල් පියවර ලෙස නියමු සැලැස්මක් සකස් කිරීම යන කරුණුවලට මෙම අධ්‍යයන වල දී මුල් තැනක් දෙන ලදී.

**එක්සත් ජාතීන් ගේ විශේෂඥයන් ගේ සහාය ඇතිව කළ මෙම අධ්‍යයනවල නිර්දේශ අනුව 1972 දී සුළු අපනයන බෝග දෙපාර්තමේන්තුව පිහිට වනු ලදී. මේ සමග ම සුළු අපනයන බෝග පර්යේෂණ මධ්‍යස්ථානයක් ද පිහිටුවීමට කටයුතු කෙරුණි. තේ, රබර් හා පොල් යන අපේ ප්‍රධාන වැවිලි බෝග වලින් උපයන රට සල්ලි ප්‍රමාණය රටේ අවශ්‍යතාවලට සරිලන ස්ථාවර තත්වයකට පත් කර ගැනීමේ දුෂ්කරතා හා අප උපයන රට සල්ලි ප්‍රමාණය වැඩිකර ගැනීමේ අවශ්‍යතාවය ද සුළු අපනයන බෝග වගාවට මෙසේ ප්‍රමුඛත්වය දීමට හේතු වූ තවත් වැදගත් කරුණකි.**

කුරුඳු, ගම්මිරිස්, කරාබු, සාදික්කා, කරදමුංගු, පැහිරි වැනි බෝග සුළු අපනයන බෝග ලෙස නම් කිරීම ජනතාව තුළ තරමක කුකුසක් ඇති කිරීමට හේතු වී ඇත. අප වැඩියෙන් මෙම බෝග හඳුනන්නේ අපේ පාරම්පරික කුළු බඩු ලෙස ය. අතීතයේ දී අප රට සල්ලි හෝ වත්කම් ලැබුවේ මූලිකත්වම මෙම කුළු බඩු වලිනි. එහෙත් වැවිලි ආර්ථිකය අප වෙත පැටවීමෙන් මෙම බෝග ඉතා සුළු තත්වයකට වැටී තේ, රබර්, පොල් ප්‍රධාන වැවිලි බවට පත් විය. රට සල්ලි ඉපයීම අතින් මෙම බෝග තුන පෙරමුණ ගැනීමත් සමග ම අපේ කුළු බඩු වගාවන් සුළු අපනයන බෝග ලෙස හැඳින්වීම ඇරඹුණි. අපේ වාර්ෂික රට සල්ලි ඉපයීම අතින් සාමාන්‍යයෙන් කුළු බඩු මගින් ලබන ආදයම 3% පමණ වීම මේ නව හැඳින්වීම වඩාත් තහවුරු කිරීමට හේතු විය. මෙම පාරම්පරික වගාවන්ට අමතරව, කොකෝවා කජු,,කෝපි, ඇඹිල්ල, තෙල්පාම්, පැපොල් හා සේර ද සුළු අපනයන බෝග වැලට එක් වූණි.

සුළු අපනයන බෝග දෙපාර්තමේන්තුව පිහිටු වන විට මෙම බෝග වගා පැවැති ආකාරය මඳක් විමසා බැලීම වැදගත් ය. සුළු ඉඩම් හිමියන් ගේ මිශ්‍ර ගෙවතු වගා ලෙස මෙම බෝග වගා කිරීම කැපී පෙනෙන ලක්ෂණයකි. තේ වතුවල අතිරේක බෝග ලෙස වගා කළ බිම් ප්‍රමාණයන් දවේ. එහෙත් මෙම බෝග ප්‍රධාන වගා ලෙස වගා කෙරුණ විශාල බිම් ප්‍රමාණ ඉතා අල්පය. මේ තත්වය වෙනස් වන්නේ කුරුඳු හා කොකෝවා වගාවන්ට පමණි. දිවයිනේ සුළු අපනයන බෝග වගා බිම් පෙදෙස් මේ අයුරින් වෙතැයි දළ අනුමාන කෙරේ.

| වගාව | අක්කර |
|---|---|
| කුරුඳු | 38,000 |
| කොකෝවා | 28,000 |
| පැහිරි | 15,000 |
| කරදමුංගු | 12,000 |
| ගම්මිරිස් | 5,500 |
| කෝපි | 5,000 |
| කරාබු | 4,000 |
| සාදික්කා | 4,500 |
| පැපොල් | 2,000 |
| එකතුව | 1,14,000 |

ආදියේ සිටම අපනයනය කෙරුණ ද, ඒ පිළිබඳ අපනයන පිළිවෙතක් හෝ ඉලක්ක නොමැතිවීම මේ වන විට කැපී පෙනුන තවත් ලක්ෂණයකි. නිෂ්පාදන ප්‍රමාණයන් පිළිබඳව ද ස්ථිර තොරතුරු ලබා ගැනීම උගහටය.

සුළු අපනය බෝග වගාවේ සැබෑ ආර්ථිකමය වටිනාකම මුල්වරට හඳුනා ගත්තේ 1972 පස් අවුරුදු සැලැස්මෙනි. කලින්

සඳහන් කළ පරිදි තේ, රබර් හා පොල්වලට සීමා වී ඇති රට සල්ලි ඉපයුම වඩාත් පුළුල් කර ගැනිම සඳහාත් ගම්බද වැසියන්ට අතිරේක ආදායම් හා රැකියා ඉඩ ලබාදීමේදී සුළු අපනයන බෝගවල ඇති වැදගත්කම මෙම සැලැස්මෙන් වටහා ගන්නා ලදී. තේ, රබර්, පොල් හා වී වගාවන්ට දැනට යටව ඇති බිම් ප්‍රමාණයත් වැඩි කළ නොහැකි තත්වයක් මතුව තිබීම ද තවත් වැදගත් සාධකයක් විය. ඊට සමග ම පිහිට වූ සුළු අපනයන බෝග දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අභිමතාර්ථයන් මෙසේ දැක්විය හැක.

1. මෙම බෝග වවන්නන්ට උපකාරි වන ව්‍යාප්ති සේවා හා පර්යේෂණ සේවා සැපයීම.
2. සුළු අපනයන බෝග ආධාර ක්‍රමය ක්‍රියාත්මක කිරීම. (මේ යටතේ මුදල් ආධාර, නොමිලේ පැල හා බීජ මෙන් ම පළිබෝධ රෝග දැඩිව පැතිරුණ අවස්ථාවන්හි නොමිලයේ කෘෂි රසායන ද සපයන ලදී.)

### 72/76 සඳහා සැලසුම් කල වගා ව්‍යාප්තිය

| බෝගය | අළුත් වගාව | නැවත වගාව | පුනරුත්ථාපනය |
|---|---|---|---|
| කොකෝවා | 10,000 | 4,500 | 1,500 |
| කජු | 25,000 | — | — |
| කෝපි | 10,000 | — | — |
| මල්බෙරි | 10,000 | — | — |
| පාම්ඔයිල් | 5,000 | — | — |
| පැපොල් | 2,500 | — | — |
| කුරුඳු | 4,000 | 5,000 | 5,000 |
| කරදමුංගු | 6,000 | — | 5,000 |
| කරාබුනැටි | 5,000 | — | — |
| සාදික්කා | 2,000 | — | — |
| ගම්මිරිස් | 10,000 | — | — |
| පැඟිරි | — | — | 15,000 |
| ලෙමන් ග්‍රාස් | 2,500 | — | — |

අපනයන බෝග දෙපාර්තමේන්තුවේ ආධාර ක්‍රමය දිස්ත්‍රික් ව්‍යාප්ති නිලධාරින් මගින් මහනුවර, මාතලේ, කුරුණෑගල, කෑගල්ල, නුවරඑළිය, බදුල්ල, මොණරාගල, රත්නපුර, කොළඹ, ගම්පහ, කළුතර, ගාල්ල, මාතර, හා හම්බන්තොට දිස්ත්‍රික්කවල ක්‍රියාත්මක වේ. දැනට ඒකාබද්ධ ග්‍රාම සංවර්ධන සැලැස්ම ක්‍රියාත්මක වන කුරුණෑගල, මාතලේ, නුවරඑළිය, හම්බන්තොට හා මාතර යන දිස්ත්‍රික්කවල සුළු අපනයන බෝග සංවර්ධනයට දැඩි අවධානයක් දී ඇත.

අක්කර බාගයකට වැඩි ඉඩම් හිමියන්ට හා තමනට අයත් නැති එහෙත් ඉඩම් හිමියාගෙන් අවුරුදු පහලොවක කැමති බල පත්‍රයක් ලබා ගත හැකි අයට ද වගා සඳහා ආධාර ලබා ගත හැක. ඔවුන් ගේ ඉල්ලුම් පත් අනුව බලපත්‍ර දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන අතර, ඉන්පසු එම ඉඩම් ව්‍යාප්ති නිලධාරින් විසින් පරීක්ෂා කරනු ලැබේ. ඉඩමේ යෝග්‍යතාවය හා සුදුසු බෝග මේ අනුව තීරණය කරනු ලැබේ. මෙහි දෙවන පියවර වනුයේ ඉඩමින් උප රිම ප්‍රයෝජනය ලැබෙන පරිදි දෙපාර්ත මේන්තු මඟපෙන්වීම්වලට අනුකූලව තම වගාවන් කරන බවට බලපත්‍ර හිමියා හා සුළු අපනයන බෝග දෙපාර්තමේන්තුව අතර ගිවිසුමකට එළඹීමයි. දෙපාර්තමේන්තුව මගින් හා ලියා පදිංචි පැල තවාන් කරුවන් මගින් පැල නොමිලේ ලබා දීම තුන්වන පියවරයි. ඉන්පසු මෙම වගාවන් ව්‍යාප්ත සේවා මණ්ඩලයේ පරීක්ෂාවන්ට ලක්වන අතර, ඔවුන් ගේ නිර්දේශ අනුව වාරික හයකින් ආධාර මුදල දෙපාර්තමේන්තු ප්‍රධාන කාර්යාලය මගින් ගෙවා නිම කරනු ලැබේ.

**ප්‍රවාහන දුෂ්කරතා හා වියදම් අඩුකර ලීම පිණිස ඒ ඒ පළාත්වල ලියාපදිංචි තවාන් කරුවන් ඇති කිරීමට දෙපාර්තමේන්තුව කටයුතු කරනු ලබයි. මේ පිළිබඳව මහ නුවර දිස්ත්‍රික් ව්‍යාප්ති නිලධාරී වීරසේකර මහතා අපට කළ විස්තරයක් මෙසේය.**

අකකර 60,000 වැනි විශාල ඉඩම් ප්‍රමා ණයක වගා කිරීම සඳහා කොකෝවා, කෝපි, කරාබු, සාදික්කා, ගම්මිරිස්, කරද මුංගු, කුරුඳු, පැඟිරි ආදි පැල විශාල ප්‍රමාණ යක් නිපදවිය යුතුව ඇත. මෙම පැලවලට ඇති ඉල්ලුම රජයේ පැල තවාන් මගින් පමණක් සපුරා ලිම කිසිසේත් කළ නො හැක්කකි. එබැවින් දෙපාර්තමේන්තුව මගින් තෝරා ගත් පෞද්ගලික පැල තවාන්කරු වන් ලියා පදිංචි කර ඔවුන් ලවා එම අවශ්‍යතාවය සපුරා ලීමට කටයුතු යොද ඇත. මෙවැනි තවාන් පවත්වා ගෙන යාම රැකියා විරහිත තරුණයන්ට ස්වයංරැකියාවන් වශයෙන් කළ හැක.

තම ප්‍රයෝජනය සඳහා කුඩා පැල තවා නක් හෝ ලියා පදිංචි කරන ලද වාණිජ පැල තවානක් හෝ පවත්වා ගෙන යාමට පෙර ඒ සඳහා සුදුසු ස්ථානයක් තෝරා ගැනීම, තවාන පවත්වා ගෙන යාම හා එය රැක බලා ගැනීම ආදිය පිළිබඳව මනා අවබෝධයක් ලබා තිබීම මෙම ව්‍යාපාරය සාර්ථකව, මෙන්ම ලාභ සහිතව ද කර ගෙන යාමට උපකාරී වේ. මේ සඳහා අවශ්‍ය වන උපදෙස් හා දැනුම අප ව්‍යාප් නිලධාරීන් විසින් ලබා දෙනු ලැබේ.

පැල තවානක් ලියාපදිංචි කිරීම යනු සුදුසුකම් ලත් තවාන්කරුවකු දෙපාර්තමේන්තු ව සමඟ කොන්ත්‍රාත් ගිවිසුම කට අත්සන් කිරීම වේ. ලියාපදිංචි තවාන් කරුවකුට දෙපාර්තමේන්තුව මගින් කෝපි හා කොකෝවා මූලික රෝපණ ද්‍රව්‍ය සපයන අතර ගම්මිරිස්, කරාබු, සාදික්කා වැනි බෝගවල බීජ හා දඬු ලබා ගැනීමට මහපෙන්වනු ඇත. පැල තවානක් ඇරඹීමට විශාල මූල ධනයක් වියදම් කළ නොහැකි අයට අත දීමක් ලෙස පොලිතීන් මළු ණය ක්‍රමයක් මත සපයන අතර, පැල මිළයට ගන්නා අවස්ථාවේ එම මුදල අඩු කර ගනු ලැබේ. මෙයට අමතරව කෘෂි රසායනික ද නොමිලේ සපයනු ඇත.

1978-09-01 දින සිට පහත සඳහන් මිළ ගණන් පැල තවාන් කරුවන්ට ගෙවනුලැබේ.

| රෝපණ ද්‍රව්‍ය | මිළ |
|---|---|
| කෝපි බීජ පැල | .50 |
| කොකෝ බීජ පැල | .75 |
| ගම්මිරිස් මුල් ඇදුනු රිකිලි | .75 |
| කරාබු බීජ පැල (මාස 6–12 වයසැති) | 1.00 |
| කරාබු බීජ පැල (මාස 20–24 වයසැති) (අහල් 24–30 උස) | 5.00 |
| සාදික්කා බීජ පැල (මාස 6–12 | 1.50 |
| සාදික්කා බීජ පැල (මාස 20–24 වයසැති) (අහල් 24–30 උස) | 5.00 |
| කරදමුංගු බීජ පැල | .75 |
| කරදමුංගු මොරයියන් | .35 |
| කුරුඳු පැල (8–10 බීජ පැල අඩංගු විය යුතුයි) | .20 |
| පැ ගිරි/ලෙමන් තෘණ මොරෙයියන් යුවල 5–6 මොරෙයියන් | .05 |
| පැපොල් බීජ පැල | .20 |

වගා කරුවන් වෙත පැල නිකුත් කිරීම දිස්ත්‍රික් ව්‍යාප්ති නිලධාරීන් විසින් ව්‍යාප්ති නිලධාරීන් ගේ නිර්දේශය මත සිදු කෙරේ. එම නියෝගයේ පිටපත පැල තවාන් කරුට ලැබෙන අතර, වගා කරුගේ මුල් පිටපත මසක් ඇතුළත තවාන් කරුට භාර දීමෙන් පැල ලබා ගත හැක. එම නියෝග මාසය කට වරක් ව්‍යාප්ති නිලධාරීන්ට භාර දුන් විට අදාළ ගෙවීම් කිරීමට කටයුතු යොද ඇති බව ද වීරසේකර මහතා පෙන්වා දුන්නේ ය.

වගා බලපත්‍රයක් නිකුත් කරන වැඩිම ඉඩම් ප්‍රමාණය අක්කර දහයකි. මෙම වගා වන්ට අවශ්‍ය වන විශේෂ පෝර දෙපාර්ත මේන්තුවේ නිර්දේශ පරිදි ලංකා පෝ සංස්ථාව මගින් සකස් කර අළෙවි කිරීමට ද කටයුතුයොද ඇත. අක්කර බාගයට අඩු ඉඩම් හිමියන්ට තම ගෙවතු වගාවන්ට අවශ්‍ය පැල ද නොමිලේ සැපයීමට දෙපාර්තමේන්තුව කටයුතු යොද තිබේ. වතු හිමියන්ට අවශ්‍ය වන වගා උපදෙස් ලබා දීමට ද ව්‍යාප්ති සේවා සූදනම් ය. පළිබෝධ රෝග වැන් නක් වැළඳුණු විට අවශ්‍ය වන කෘෂි-රසායනික නිර්දේශ කිරීම හා එම රෝග පැතිරීම වැළැක්වීමට ද කටයුතු කිරීම දෙපාර්තමේන්තුවේ තවත් වගකීමක්ව ඇත.

## අපනයන බෝග සඳහා වන සහනාධාර

| බෝගය | කටයුත්ත | මුළු ගණන රුපියල් |
|---|---|---|
| කොකෝවා | නව වගාව | 275 |
| | නැවත වගාව | 2750 |
| කෝපි | නව වගාව | 2750 |
| කුරුඳු | නව වගාව | 1000 |
| | නැවත වගාව | 2500 |
| ගම්මිරිස් | නව වගාව | 25[illegible] |
| කරදමුංගු | නව වගාව | 150[illegible] |
| | නැවත වගාව | 1500 |
| සිංකෝනා | නව වගාව | 1500 |
| පැඟිරි | නැවත වගාව | 1000 |
| සේර | නව වගාව | 1000 |
| පැපොල්(කිරි සඳහා | නව වගාව | 1000 |
| කරාබු | නව වගාව | 1000 |
| යාදික්කා | නව වගාව | 1000 |

නව සංවර්ධන සැලැස්මට අනුව දෙපාර්ත මේන්තුවේ අරමුණ අළුතෙන් වගා කිරීම මෙන් ම, පෝර යෙදීම පලිබෝධ හා රෝග පාලනය, පුනරුත්ථාපනය හා ඉහළ වගා පිළිවෙත් මගින් වගාවන් දියුණු කිරීම හා අපනයන බෝග ආධාර සැලැස්ම ක්‍රියාත් මක කිරීමයි. මෙම බෝග බහු වාර්ෂිකයන් නිසා නිෂ්පාදනයේ සැලකිය යුතු වැඩිවීමක්

දැකීමට අඩුතරමින් අවුරුදු පහක කාලයක් වත් ගත වේ. මේ අනුව දෙපාර්තමේන්තුවේ සැලැස්මේ ප්‍රතිඵල නිසි ලෙස දක්නට ලැබෙනු ඇත්තේ 1980 සිට ය. මෙම සැලැස්ම අකුරටම ඉටුකර ගත හැකි වුවත්, ලෝක වෙළඳ පලේ ඇති ඉල්ලුම නිසා අතිරික්ත ප්‍රශ්නයක් පැන නොනගින බව ද වාර්තා වී ඇත. දෙපාර්තමේන්තුව මෙතෙක් ගෙවා ඇති ආධාර මුදල් ප්‍රමාණයන් මෙසේය.

| | | රු. දහස් |
|---|---|---|
| 1973 | ... | 283.7 |
| 1974 | ... | 497.8 |
| 1975 | ... | 976.4 |
| 1976 | ... | 1095.6 |
| 1977 | ... | 1019.0 |
| | | 3872.5 |

මහ බැංකු වාර්තාවන් 1971–76 කාලය තුළ මෙම ප්‍රධාන බෝග වගා වර්ධනය, අස්වැන්න හා රට සල්ලි ඉපයූ ආකාරය දක්වන්නේ මෙසේ ය.

1971 දී රුපියල් දශ ලක්ෂ 43.2 ක් වූ ආදයම 1976 දී දශ ලක්ෂ 122.9 දක්වා ඉහළ යෑම සුළු අපනයන බෝග සංවර්ධනය කිරීමෙන් අප ආර්ථිකයට ලබා ගත හැකි පිටුවහලේ තරම කදිමට දක්වන ඉඟියකි.

ලංකා ප්‍රමිති කාර්යාංශය මගින් සුළු අපනයන බෝග සඳහා ක්‍රියාත්මක කරන පූර්ව අපනයන සහතික ක්‍රමය හැරුණු විට සුළු අපනයන බෝග වෙළඳාම දේශීය වශයෙන් මෙතෙක් කිසිදු බලපෑමකටයටත්ව නැත. මේ තත්වය නිසාවෙන් පාඩු සිදු වී තිබෙන්නේ වගා කරුවන්ට බව පවසන තතු දන්නෝ මේ අඩුව පිරිමැසීමට යමක් කළයුතු කාලය පමා වූවා වැඩි බව ද පවසති. වගාකරුවන් වෙළඳුන් ගේ ග්‍රහණයෙන් මුදා ගැනීමට ගත හැකි එක් මඟකි සුළු අපනයන බෝග සමූපකාර පිහිටුවීම. එහෙත් ගැටඹේ, හාරිස්පත්තුව හා වත්තේගම පිහිට වූ මෙවැනි සමූපකාර ක්‍රියාත්මක නොවීම කුළු බඩු වෙළඳ රටාව පසුපස ඇති ප්‍රබල බලපෑම් මොනවාට පැහැදිලි කරන බව පෙන්වා දෙන ඔවුන් මෙහිලා රජය යම්කිසි ක්‍රියා මාර්ගයක් ගත යුතු බව ද පෙන්වා දෙති.

දනට පවතින වෙළඳ රටාව නිසාවෙන් සුළු අපනයන අස්වනු හොරෙන් නෙලා ගැනීම වවන්නන් මුහුණ පා ඇති තවත් ප්‍රශ්නයකි. හොරුන් ගෙන් මිදීමට වවන්නන් බෝග මේරීමට පෙර නෙලීම නිසාවෙන් වන හානිය සුළු පටු නොවේ. ගම මට්ටමේ කුළු බඩු මිළට ගැනීම හා වෙළඳාම නිදහසේ කිරීම මීට රුකල දෙන හේතුවක්ව වී ඇත. ලියාපදිංචි වෙළඳුන්ට බලපත්‍ර ඉඩම හිමියන් ගෙන් පමණක් මිළට ගැනීමට සිදු වන අන්දමේ නීති රීති පැණවීම වවන්නන් කරන තවත් යෝජනාවකි. ඇතමුන් දනට පවතින තත්වය නිසාවෙන් දුර්මුඛව වගාවන් අත්හැර දමූ අවස්ථා ද වේ.

## සුළු අපනයන බෝග ව්‍යාප්තිය, අස්වැන්න හා විදේශ විනිමය

| | 1971 | 1972 | 1973 | 1974 | 1975 | 1976 |
|---|---|---|---|---|---|---|
| | | | අක්කර | | | |
| 1. කොකෝවා | 24,300 | 24,090 | 23,858 | 22,185 | 20,960 | 20,799 |
| 2. කුරුඳු | 55,414 | 48,660 | 53,296 | 54,562 | 53,600 | 53,907 |
| 3. කරදමුංගු | 8,930 | 9,018 | 9,243 | 9,590 | 10,379 | 10,075 |
| 4. පැඟිරි | 5,426 | 10,776 | 13,803 | 13,715 | 11,154 | 10;573 |
| 5. ගම්මිරිස් | 16,611 | 14,538 | 14,683 | 14,752 | 15,927 | 16,149 |
| ාෂ්පාදනය. | | | හොණ්ඩර | | | |
| 1. කොකෝවා | 273,906 | 288,617 | 296,607 | 274,866 | 234,596 | 224,516 |
| 2. කුරුඳු | 269,848 | 310,155 | 287,616 | 343,172 | 328,648 | 347,980 |
| 3. කරදමුංගු | 169,971 | 169,752 | 89,265 | 94,344 | 81,024 | 80,518 |
| 4. පැ ඟිරි | 129,158 | 155,007 | 109,626 | 117,368 | 72,792 | 31,348 |
| 5. ගම්මිරිස් | 251,723 | 273,812 | 292,704 | 274,850 | 257,169 | 326,159 |
| විදේශ විනිමය. | | | රුපියල් දසලක්ෂ | | | |
| 1. කොකෝවා | 6.2 | 5.1 | 6.1 | 10.8 | 8.4 | 13.1 |
| 2. කුරුඳු | 27.8 | 30.3 | 37.8 | 59.4 | 39.4 | 69.9 |
| 3. කරදමුංගු | 5.8 | 5.7 | 8.4 | 6.5 | 12.7 | 12.2 |
| 4. පැඟිරි | 2.1 | 2.4 | 4.2 | 5.6 | 2.0 | 3.5 |
| 5. ගම්මිරිස් | 0.7 | 0.9 | 12.9 | 3.4 | 1.2 | 0.2 |